# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1983 අංක 32 දරන
# සමුපකාර සමිති (සංශෝධන)
# පනත

---

[සහතිකය සටහන් කළේ 1983 අගෝස්තු මස 24 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1983 අගෝස්තු මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 75 යි

තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1983 අංක 32 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1983 අගෝස්තු මස 24 වන දින]

**එල්. ඩී.—ඕ. 55/81**

**ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය.**

1. මේ පනත 1983 අංක 32 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන පනතේ 39 වන වගන්තිය සංශෝධනය කිරීම.**

2. (මෙහි මින් මතු " ප්‍රධාන ප්‍රඥප්තිය " යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ 39 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (1) ලියාපදිංචි කළ සමිතියක් විසින් සාමාජිකයකු නොවන කිසිම තැනැත්තකුට යම් ණයක් නොදිය යුතු ය :

එසේ වුව ද ලියාපදිංචි කළ සමිතියක් විසින් රෙජිස්ට්‍රාර්වරයාගේ අනුමතය ඇතිව සහ ඔහු විසින් නියම කරනු ලබන කොන්දේසි මත වෙනත් ලියාපදිංචි කළ සමිතියකට ණය දීම සහ බඩු බෙදා හැරීම සඳහා සමිතියේ අනුයෝජිතයකු ලෙස පත් කරන ලද යම් ලියාපදිංචි කළ වෙළෙන්දකු වෙත ඒ බඩු ණයට සැපයීම කරනු ලැබිය හැකිය. ".

**ප්‍රධාන ප්‍රඥප්තියේ VIII වන පරිච්ඡේදයේ ශීර්ෂ පාඨය ප්‍රතියෝජනය කිරීම.**

3. ප්‍රධාන ප්‍රඥප්තියේ VIII වන පරිච්ඡේදයේ සඳහන් වන "විගණනය, විභාගය, පරීක්ෂණය හෝ විමර්ශනය" යන ශීර්ෂ පාඨය වෙනුවට පහත දැක්වෙන අලුත් ශීර්ෂ පාඨය ආදේශ කරනු ලැබේ :—

"**ගිණුම්, අයවැය, විගණනය, විභාගය, පරීක්ෂණය හෝ විමර්ශනය.** ".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 43අ සහ 43ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.**

4. ප්‍රධාන ප්‍රඥප්තියේ VIII වන පරිච්ඡේදයේ අලුත් ශීර්ෂ පාඨයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා ඒ ප්‍රඥප්තියේ 43අ සහ 43ආ වගන්ති ලෙස බලපැවැත්විය යුතු ය.

"**සමිතියේ ගිණුම්.**

43අ. (1) සෑම ලියාපදිංචි සමිතියක් ම, සමිතියේ ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් පවත්වාගෙන යාමට සැලැස්විය යුතු ය.

(2) රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් නියම කරනු ලබන පරිදි, සමිතියේ කටයුතුවලට අදාළ ගිණුම් හා සංඛ්‍යාන පිළිබඳ වාර්ෂික ප්‍රකාශයක් සෑම ලියාපදිංචි කළ සමිතියක් විසින් ම සකස් කරනු ලැබිය යුතු ය. ඒ ගිණුම් ප්‍රකාශය, එය අදාළ වන මුදල් වර්ෂය අවසන් වී මාස තුනක් ඇතුළත රෙජිස්ට්‍රාර්

2—ඒ 69792 — 12650 (83/05)

වරයා වෙත හෝ ඔහු විසින් බලය දෙන ලද වෙනත් තැනැත්තා වෙත හෝ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ විධිවිධානවලින් කිසිවක් අනුව කටයුතු කිරීම ලියාපදිංචි කළ සමිතියක් විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක, ඒ සමිතියේ කාරක සභාවේ සෑම සාමාජිකයකු ම වරදකට වරද කරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරද කරුවකු කරනු ලැබූ විට රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය:

එසේ වුව ද වරදක් කරනු ලැබුවේ තමාගේ අනු දැනීම නොමැතිව බව සහ ඒ වරද කිරීම වැළැක් වීමට නිසි සියලු උද්යෝගයෙන් තමා සෑම විටම ක්‍රියා කළබව ඒ සාමාජිකයා විසින් ඔප්පු කරනු ලැබුවහොත් ඔහු ඒ වරදට වරදකරු නොවන්නේ ය.

අයවැය පිළියෙල කිරීම.

43ආ. (1) සෑම ලියාපදිංචි කළ සමිතියක් විසින් ම, ආදායම් ඉලක්ක, පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම, මූල්‍ය සහ මුදල් සම්පත්, මුදල් ආයෝජන, අයවැයගතකරන ලද ලාභාලාභ ගිණුම්, ආදායම් සහ වියදම් ගිණුම් සහ ශේෂ පත්‍ර දක්වෙන අය වැය ලේඛනයක්, සෑම මුදල් වර්ෂයක් වෙනුවෙන් ම පිළියෙල කරනු ලැබිය යුතු ය.

(2) ඒ අයවැය ලේඛනය අදාළ වන මුදල් වර්ෂය ආරම්භ වීමට පෙරාතුව වූ මාස දෙකට කලින්, එය අනුමතය සඳහා සමිතියේ මහා මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) එම අයවැය ලේඛනය අදාළ වන මුදල් වර්ෂය ආරම්භ වීමට පෙරාතුව වූ එක් මාසයකට කලින්, ඒ අයවැය ලේඛනයේ පිටපතක් රෙජිස්ට්‍රාර්වරයා වෙත යවනු ලැබිය යුතු ය.

(4) එම අයවැය ලේඛනය පිළියෙල කරනු ලැබිය යුතු ආකෘතිය සහ ආකාරය ද, එහි අඩංගු විය යුතු අවම තොරතුරු ද රෙජිස්ට්‍රාර්වරයා විසින් නිර්ණය කරනු ලබන පරිදි විය යුතු ය.

(5) ලියාපදිංචි කළ සමිතියක සාමාජික සංඛ්‍යාව සහ එහි ආදායම සහ වියදම සැලකිල්ලට ගෙන මේ වගන්තියේ අවශ්‍යතාවලින් යම් සමිතියක් නිදහස් කිරීම අවස්ථානුකූල යයි අමාත්‍යවරයා අදහස් කරන අවස්ථාවක, විශේෂ හෝ සාමාන්‍ය නියමයක් මගින් යම් සමිතියක් අමාත්‍යවරයා විසින් මේ වගන්තියේ අවශ්‍යතාවලින් නිදහස් කරනු ලැබිය හැකි ය.".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය සංශෝධනය කිරීම.

(i) එහි (4) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(4) රෙජිස්ට්‍රාර්වරයාට හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් තත් කාර්යය සඳහා සාමාන්‍ය හෝ විශේෂ නියමයක් මගින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකුට, ලියා පදිංචි කළ සමිතියක් විසින් පවත්වාගෙන යනු ලබන සියලු පොත්, ලේඛන, ගිණුම් සහ ලියවිලි, සුරැකුම් පත් සහ අතේ ඇති මුදල් සියලු අවස්ථාවල දී ලබා ගැනීමටද, පරීක්ෂා කිරීමට ද හිමිකම් තිබිය යුතු ය. තවද ඉහත කී දේ භාරව සිටින හෝ පවත්වාගෙන යන හෝ සන්තකයෙහි ඇතිව සිටින සෑම තැනැත්තකු ම ඒවා රෙජිස්ට්‍රාර්වරයාට හෝ ඒ බලය දෙන ලද තැනැත්තාට ඉදිරිපත් කළ යුතු ය. නැතහොත් සමිතියේ ගනුදෙනු සහ වැඩ කටයුතු සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයා හෝ ඒ පරීක්ෂණය හෝ විගණනය කරන ඒ බලය දෙන ලද තැනැත්තා විසින් නියම කරනු ලබන තොරතුරු සැපයිය යුතු ය.".

(ii) (6) වන උපවගන්තියේ—

(අ) (අ) ඡේදයෙහි "පනත යටතේ පනවනු ලැබූ රීතිවල හෝ සමිතියේ" යන වචන වෙනුවට "පනත යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ හෝ පනවනු ලැබූ රීතිවල හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් අනුමත කරන ලද, සමුපකාර සමිතිවලට හෝ මුදල් කාර්ය පටිපාටියට අදාළ රීතිවල නැතහොත් නියෝගවල හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද පොදු විධාන කිසිවක හෝ සමිතියේ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) (ඇ) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඇ) රෙජිස්ට්‍රාර්වරයා විසින් කරන ලද තීරණයට අනුකූලව ක්‍රියා නොකරන ලද අවස්ථාවක 66(2) වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය." ;

(ඇ) එහි (ඈ) ඡේදය ඉවත් කිරීමෙන්.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඈ) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ඈ) වංචාවක් හෝ අක්‍රමිකතාවක් තිබෙන බවට විශ්වාස කිරීමට ඒ විභාගය පවත්වන අතරතුරදී ඔහුට හේතු ඇති අවස්ථාවක, සමිතියේ ගිණුම් පොත් හෝ ලේඛන තම භාරයට ගැනීමේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තියේ (7) වන උපවගන්ති යට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුලත් කිරී මෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(8) මේ වගන්තියේ විධිවිධාන යටතේ පරීක්ෂණයක හෝ විමර්ශනයක කාර්ය සඳහා, රෙජිස්ට්‍රාර්වරයාට හෝ ඔහු විසින් පරීක්ෂණය හෝ විමර්ශනය පැවැත්වීම සඳහා බලය දෙන ලද යම් තැනැත්තකුට—

(අ) සමිතියේ ගනුදෙනු කිසිවක් පිළිබඳව හෝ එහි කටයුතු පාල නය කිරීම සම්බන්ධයෙන් හෝ වැදගත් තොරතුරු සැප යිය හැකි යයි රෙජිස්ට්‍රාර්වරයා හෝ පරීක්ෂණය පැවැත් වීමට ඔහු විසින් බලය දෙන ලද තැනැත්තා හෝ අදහස් කරන, සමිතියේ කලින් සිටියා වූ හෝ දැනට සිටින්නා වූ නිලධරයකු, අනුයෝජිතයකු, සේවකයකු හෝ සාමාජික යකු නැතහොත් වෙනත් යම් තැනැත්තකු කැඳවීමට;

(ආ) සමිතියේ කටයුතුවලට අදාළ යම් පොතක, ලේඛනයක, මුද ලක, ඇපයක හෝ වෙනත් දේපළක සන්තකය නැත හොත් භාරය දරන සමිතියේ කලින් සිටියා වූ හෝ දැනට සිටින්නා වූ නිලධරයකුට, අනුයෝජිතයකුට, සේවක යකුට, සාමාජිකයකුට හෝ වෙනත් තැනැත්තකුට ඒවා ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට;

(ඇ) තමා විසින් විධාන කරනු ලබන කාරණා තීරණය කිරීම පිණිස තමා විසින් නිශ්චය කරනු ලබන වේලාවක සහ ස්ථානයක සමිතියේ සාමාජිකයන්ගේ මහා සභා රැස්වීමක් කැඳවීමට; සහ

(ඈ) වංචාවක් හෝ අක්‍රමිකතාවක් හෝ තිබෙන බවට එවැනි පරීක්ෂණයක දී හෝ විමර්ශනයක දී විශ්වාස කිරීමට ඔහුට හේතු ඇති අවස්ථාවක, සමිතියේ ගිණුම් පොත් හෝ ලේඛන තම භාරයට ගැනීමට

බලය තිබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ IX වන පරිච්ඡේදයේ ශීර්ෂ පාඨය ප්‍රතියෝජනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ IX වන පරිච්ඡේදයේ "ලියාපදිංචි කළ සමිතියක කාරක සභාව විසුරුවා හැරීම" යන ශීර්ෂ පාඨය වෙනුවට පහත දැක්වෙන අලුත් ශීර්ෂ පාඨය ආදේශ කරනු ලැබේ:—

"ලියාපදිංචි කළ සමිතියක නිලධරයන්ගේ සේවය අත්හිටුවීම හෝ වැඩ තහනම් කිරීම හා නිලධරයන් ඉවත් කිරීම සහ ලියා පදිංචි කළ සමිතියක කාරක සභාව විසුරුවා හැරීම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(i) එහි (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(1) 46 වන වගන්තිය යටතේ වූ විභාගයකින් හෝ 47 වන වගන්තිය යටතේ වූ පරීක්ෂණයකින් නැතහොත් විමර්ශනයකින් හෝ පසු, ලියාපදිංචි කළ යම් සමිතියක

කාරක සභාව එහි යුතුකම් නිසි ආකාරයෙන් ඉටු නොකරන බව රෙජිස්ට්‍රාර්වරයාගේ මතය වුවහොත්, කාරක සභාව විසුරුවා හැරීම සම්බන්ධයෙන් එහි විරෝධතා කිසිවක් වේ නොත් ඒ විරෝධතා ප්‍රකාශ කරනු පිණිස ඔහු විසින් කාරක සභාවට අවස්ථාවක් දීමෙන් පසු සහ ඔහු විසින් කැඳවනු ලැබූ සමිතියේ මහා සභා රැස්වීමක දී ඒ විරෝධතා සලකා බැලීමෙන් පසු, ලියවිල්ලකින් වූ නියෝගයක් මගින්—

(අ) කාරක සභාව විසුරුවා හරිනු ලැබිය හැකි ය ; තව ද

(ආ) මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි පත් කරනු ලබන සුදුසු තැනැත්තකු හෝ තැනැත්තන් විසින් සමිතියේ කටයුතු කළමනාකරණය හා පරිපාලනය කළ යුතු යයි විධාන කරනු ලැබිය හැකි ය.";

(ii) එහි (4) වන උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ආ) සමිතියේ යථා පරිදි සංස්ථාපනය කරන ලද කාරක සභාවේ සියලු බලතල, අයිතිවාසිකම් හා වරප්‍රසාද තිබිය යුතු අතර ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය. තව ද, ඒ සමිතියේ කටයුතු කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම උදෙසා අවශ්‍ය වන අවස්ථාවක, මහා මණ්ඩලය සතු බලතල අතුරින් එසේ අවශ්‍ය වන බලතල ද, ඒ මහා මණ්ඩලය බැහැර කෙරෙන පරිදි, තිබිය යුතු අතර, ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය."; තව ද

(iii) එහි (9) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(10) 46 වන වගන්තිය යටතේ වූ විභාගයක් හෝ 47 වන වගන්තිය යටතේ වූ පරීක්ෂණයක් නැතහොත් විමර්ශනයක් නිම කිරීමට පෙර, කාරක සභාවට විරුද්ධව මුල් බැල්මට චෝදනාවක් තහවුරු වී ඇතැයි රෙජිස්ට්‍රාර්වරයාගේ මතය වේ නම් ඒ කාරක සභාව මාස හයක කාල සීමාවක් සඳහා අත්හිටුවීමට ද සමිතියේ වැඩ කටයුතු කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම පිණිස අන්තර් කාලීන මණ්ඩලයක් පත් කිරීමට ද ඔහුට බලය තිබිය යුතු ය. ඒ කාරක සභාව අත්හිටුවනු ලැබූ දින සිට මාස හයක කාල සීමාවක් ඇතුළත ඒ විභාගය හෝ විමර්ශනය රෙජිස්ට්‍රාර්වරයා විසින් නිම කළ යුතු අතර, ඒ කාරක සභාව (1) වන උපවගන්තිය යටතේ විසුරුවා හැරීම සම්බන්ධයෙන් අවසාන තීරණයක් ගනු ලැබිය යුතු ය.".

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 48අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :— **ප්‍රධාන ප්‍රඥප්තියේ 48අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.**

" නිලධරයන්ගේ සේවය අත් හිටුවීම හෝ වැඩ තහනම් කිරීම හා නිලධරයන් ඉවත් කිරීම යනාදිය.

48අ. (1) 46 වන වගන්තිය යටතේ වූ විභාගයකින් හෝ 47 වන වගන්තිය යටතේ වූ පරීක්ෂණයකින් නැතහොත් විමර්ශනයකින් හෝ පසුව යම් ලියාපදිංචි කළ සමිතියක යම් නිලධරයකු හෝ සේවානියුක්තයකු තම කාර්ය නිසි ආකාරයෙන් ඉටු නොකරන බව හෝ කාර්යක්ෂම ලෙස තම කාර්ය ඉටු කිරීමට නුසුදුසු බව නැතහොත් අනාකාරයකින් නොහැකි බව රෙජිස්ට්‍රාර්වරයාගේ මතය වුවහොත්, මේ පනතෙහි හෝ, 1972 අංක 12 දරන සමූපකාර සේවක කොමිෂන් සභා පනතේ හෝ වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, සිය විරෝධතා දැක්වීමට එම නිලධරයාට හෝ සේවානියුක්තයාට අවස්ථාවක් දීමෙන් පසුව, අවශ්‍ය විභාගය අවසන් වන තුරු ඔහු විසින් ලිය විල්ලකින් වූ නියෝගයක් මගින්, අවස්ථාවෝචිත පරිදි, ඒ නිලධරයාගේ හෝ සේවානියුක්තයාගේ සේවය අත්හිටුවීම හෝ වැඩ තහනම් කිරීම කළ හැකි අතර, ඒ විභාගයෙන් පසුව එම නිලධරයා හෝ සේවානියුක්තයා ධුරයෙන් ඉවත් කළ හැකි ය:

එසේ වුවද, මේ උපවගන්තිය යටතේ කරන ලද ඉවත් කිරීමේ නියෝගයකින් අනාප්තියට පත් යම් සේවානියුක්තයකු විසින් දින තිහක කාලයක් ඇතුළත 1972 අංක 12 දරන පනත යටතේ පිහිටුවන ලද සමූපකාර සේවක කොමිෂන් සභාව වෙත ඊට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය ; තව ද, ඒ කොමිෂන් සභාවේ තීරණය අවසානාත්මක වන්නේ ය ;

(2) (1) වන උපවගන්තිය යටතේ යම් නිලධරයකු හෝ සේවානියුක්තයකු ඉවත් කරනු ලැබ ඇත්තා වූ ද, ඒ ඉවත් කිරීමේ නියෝගය සමූපකාර සේවක කොමිෂන් සභාව විසින් ස්ථිර කොට ඇත්තා වූ නැතහොත් දින තිහක කාලයක් ඇතුළත ඒ නියෝගයට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කර නොමැත්තා වූ ද අවස්ථාවක වෙනත් නිලධරයකු හෝ සේවානියුක්තයකු අවස්ථාවෝචිත පරිදි, තෝරා පත් කර ගැනීම හෝ පත් කිරීම ඒ තෝරා පත් කර ගැනීම හෝ පත් කිරීම සම්බන්ධයෙන් අදාළ වන විධිවිධාන අනුව කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය සංශෝධනය කිරීම.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(1) 46 වන වගන්තිය යටතේ වූ විභාගයකින් පසු, හෝ 47 වන වගන්තිය යටතේ වූ පරීක්ෂණයකින් නැතහොත් විමර්ශනයකින් පසු, හෝ ලියාපදිංචි කළ සමිතියක සාමාජිකයන්ගෙන්

හතරෙන් තුන් කොටසක් විසින් එය විසුරුවා හැරීම සඳහා කරනු ලබන ඉල්ලීමක් ලැබීමෙන් පසු හා තම විරෝධතා ඉදිරිපත් කිරීමට සමිතියට සහ ඒ සමිතියේ ණය හිමියන්ට අවස්ථාවක් ලබා දීමෙන් පසු, ඒ සමිතිය විසුරුවා හැරිය යුතු යයි රෙජිස්ට්‍රාර්වරයා අදහස් කරයි නම්, ඔහු විසින් තම අත්සන යටතේ වූ නියෝගයක් මගින්, ඒ සමිතියේ ලියාපදිංචිය අවලංගු කරනු ලැබිය හැකි ය.".

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තිය සංශෝධනය කිරීම.

(i) එහි (3) වන උපවගන්තියේ "ඒ තහනමට ගෙන විකිණීම සම්බන්ධයෙන්" යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය දක්වා ඇති වචන සහ ඉලක්කම් වෙනුවට "ඒ තහනමට ගෙන විකිණීම කෙරෙහි සහ ඊට අදාළව සිවිල් නඩු විධාන සංග්‍රහයේ 226 වන වගන්තියේ සිට 297 වන වගන්තිය දක්වා වූ වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය." යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(ii) එහි (4) වන උපවගන්තියේ "අපරාධ නඩු විධාන සංග්‍රහයේ 312 වන වගන්තියේ (එහි (1) වන උපවගන්තියේ (අ) හා (ඇ) ඡේද හැර) විධිවිධාන" යන වචන හා ඉලක්කම් වෙනුවට "1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) සහ (ඇ) ඡේද හැර) විධිවිධාන" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඒ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ඒඒ) ලියාපදිංචි කළ සමිතියක සාමාජිකයකු කළමනාකරණ කාරක සභාවේ හෝ ප්‍රාදේශීය හෝ ශාඛා කාරක සභාවක සාමාජිකයකු ලෙස තෝරා පත් කර ගැනීම සම්බන්ධයෙන් වූ නුසුදුසුකම් නියම කිරීම ;".

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය සංශෝධනය කිරීම.

(i) එහි (1) වන උපවගන්තියේ "සහභාගි වූ යම් තැනැත්තකුගෙන්" යන වචන වෙනුවට "සහභාගි වූ, මේ පනතෙහි හෝ වෙනත් පනතක විධිවිධානවලට හෝ ඒ යටතේ සාදන රීතිවලට හෝ නියෝගවලට නැතහොත් සමිතියේ අතුරු ව්‍යවස්ථාවලට හෝ කාරක රීතිවලට හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් අනුමත කරන ලද මුදල් කාර්ය පරිපාටියට හෝ රෙජිස්ට්‍රාර්වරයා හෝ සමුපකාර සේවක කොමිෂන් සභාව හෝ විසින් නිකුත් කරන ලද යම් පොදු විධිවිධානවලට පටහැනි ව, සමිතියේ අරමුදල් ප්‍රයෝජනයට ගත් යම් තැනැත්තකුගෙන්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ii) එහි (2) වන උපවගන්තියෙහි—

(අ) "සමිතිය විසින්" යන වචන වෙනුවට "රෙජිස්ට්‍රාර් වරයා විසින්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) "අපරාධ නඩු විධාන සංග්‍රහයේ 312 වන වගන්තියෙහි (එම වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේද හැර) විධිවිධාන" යන වචන හා ඉලක්කම් වෙනුවට "1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (එම වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේද හැර) විධිවිධාන" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 66අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 66අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

"සාමාජිකයන් නම් කිරීම.

66අ. ලියාපදිංචි කළ සමිතියක කටයුතු කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම සහතික කිරීමේ කාර්යය සඳහා හෝ ආණ්ඩුව හෝ යම් රාජ්‍ය බැංකුවක් හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ විසින් එම ලියාපදිංචි කළ සමිතිය සම්බන්ධයෙන් කරනු ලබන යම් ආයෝජන හෝ ඊට මුදලින් හෝ බඩුවලින් දෙනු ලබන අත්තිකාරම් හෝ ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා, අවශ්‍ය යයි හෝ අවස්ථාවෝචිත යයි රෙජිස්ට්‍රාර්වරයා විසින් අදහස් කරනු ලබන අවස්ථාවක, මේ පනතේ හෝ වෙනත් යම් නීතියක හෝ ඒ ලියාපදිංචි කළ සමිතියේ අතුරු ව්‍යවස්ථාවල ඊට පටහැනිව කුමක් සඳහන් වුව ද, ඒ කාර්යය සඳහා අවශ්‍ය යයි හෝ අවස්ථාවෝචිත යයි ඔහු අදහස් කරන තැනැත්තන් සංඛ්‍යාවක් ඒ ලියාපදිංචි කළ සමිතියේ කාරක සභාවේ සාමාජිකයන් හැටියට ඔහු විසින් නම් කළ හැකි ය :

එසේ වුවද, ඒ නම් කළ සාමාජිකයන්ගේ සංඛ්‍යාව ඒ කාරක සභාවේ සාමාජිකයන්ගේ මුළු සංඛ්‍යාවෙන් අර්ධයකට අඩු විය යුතු ය.";

ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"විශ්වාසය කඩ කිරීම සම්බන්ධයෙන් නිලධරයන් ආදීන්ගේ වගකීම.

67. ලියාපදිංචි කළ සමිතියක ගණන්, 44 වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි විගණනය කරනු ලැබීමෙන් පසුව හෝ, 46 වන වගන්තිය යටතේ වූ විභාගයකින් පසුව හෝ, ලියාපදිංචි කළ සමිතියක පොත් පරීක්ෂා කර බැලීම සහ එහි කටයුතු විමර්ශනය කිරීම 47 වන වගන්තිය යටතේ කිරීමෙන් පසුව හෝ, සමිතියේ නිලධරයකු හෝ

සාමාජිකයකු හෝ සේවකයකු වශයෙන් වූ තම තත්ත්වයෙන් යම් මුදලක්, යම් බඩු හෝ දේපළ භාරව සිටින හෝ යම් අවස්ථාවක භාරව සිටි තැනැත්තා හෝ ඒ මුදල්, බඩු හෝ දේපළ පිළිබඳ ආධිපත්‍යය ඇතිව සිටින හෝ යම් අවස්ථාවක ඇතිව සිටි හෝ තැනැත්තකු විසින් ඒ නිලධරයා, සාමාජිකයා හෝ සේවකයා වශයෙන් තමා ළඟ තබා ගෙන සිටින හෝ තමාගෙන් අයවිය යුතු බවට තමා විසින් තබන ලද හෝ අත්සන් කරන ලද ගණුම් පොත්වල හෝ ප්‍රකාශවල පෙන්නුම් කෙරෙන යම් මුදලක් හෝ එහි ශේෂයක් ගෙවන ලෙස හෝ ඉදිරිපත් කරන ලෙස හෝ එවැනි යම් බඩුවල හෝ දේපළවල වටිනා කම ගෙවන ලෙස හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ තැනැත්තාට නියම කිරීම නීත්‍යානුකූල විය යුතු ය. තව ද එසේ නියම කරනු ලැබීමෙන් පසු ඒ තැනැත්තා විසින් ඒ මුදල හෝ එහි ශේෂය හෝ වහාම ගෙවීම හෝ ඉදිරිපත් කිරීම හෝ එම බඩු වල හෝ දේපළවල වටිනාකම ගෙවීම හෝ යථා පරිදි ඒ සඳහා ගණන් ඉදිරිපත් කිරීම පැහැර හැරියහොත් ඔහු සාපරාධී විශ්වාස කඩ කිරීමේ වරදට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, අවුරුදු දහයක් නොඉක්මවන කාලසීමාවකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කරනු ලැබීමට යටත් විය යුතුවාක් මෙන් ම දඩයකට ද, ඒ දඬුවම මහේස්ත්‍රාත්වරයකුගේ සාමාන්‍ය අධිකරණ බලය ඉක්ම වූව ද, ඔහු යටත් විය යුතු ය.".

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 67අ වන වගන්තිය ලෙස බල පැවැත්විය යුතු ය :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 67අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"නඩු පැවරීම මෙහෙය වීම කවුරුන් විසින් කළ යුතු ද යන වග

67අ. ලියාපදිංචි කළ සමිතියකට අදාළ යම් කරුණක් සම්බන්ධයෙන් විමර්ශනය පැවැත්වීම, විභාග කිරීම සහ 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XVII වන පරිච්ඡේදය යටතට වැටෙන නඩු පැවරීම් මෙහෙයවීම සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධරයකු විසින් කිරීම නීත්‍යනුකූල වන්නේ ය.".

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(3) මේ පනත මගින් අවලංගු කරන ලද යම් ප්‍රඥප්තියක් යටතේ කරන ලද හෝ කරන ලදැයි සැලකෙන සියලු පත් කිරීම් සහ නියෝග, නිකුත් කරනු ලැබූ හෝ නිකුත් කරන ලදැයි සැලකෙන සියලු නිවේදන හා දැන්වීම්, බේරුම්කරුවන් විසින් කරන ලද හෝ කරන ලදැයි සැලකෙන සියලු ප්‍රදාන සහ රෙජිස්ට්‍රාර්වරයා විසින් ගන්නා ලද හෝ ගන්නා ලදැයි සැලකෙන සියලු තීරණ සහ පවරනු ලැබූ හෝ පවරන ලදැයි සැලකෙන සියලු සිවිල් නඩු

හා වෙනත් නඩු කටයුතු හා උද්ගතව ඇති සියලු ආරාවුල් හැකි තාක් දුරට, පිළිවෙළින්, මේ පනත යටතේ කරනු ලැබූ ලෙස, නිකුත් කරනු ලැබූ ලෙස, කරනු ලැබූ ලෙස, ගනු ලැබූ ලෙස, පවරනු ලැබූ ලෙස හා උද්ගත වූ ලෙස සලකනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තිය සංශෝධනය කිරීම.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(2) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් වරදක් සිදු කරන සෑම තැනැත්තකු ම මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට අවුරුදු දෙකක් නොඉක්මවන කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් දෙලොස් දහසක් නො ඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකට ම හෝ, ඒ දඬුවම මහේස්ත්‍රාත්වරයකුගේ සාමාන්‍ය අධිකරණ බලය ඉක්මවූව ද ඔහු යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 72අ වගන්තිය ඇතුළත් කිරීම.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 72අ වගන්තිය ලෙස බල පැවැත්විය යුතු ය :—

"රෙජිස්ට්‍රාර්වරයා ආදීන්ගේ ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.

72අ. මේ පනත යටතේ ස්වකීය කාර්යයන් ඉටු කිරීමේ දී හෝ කර්තව්‍ය කිරීමේ දී සද්භාවයෙන් කරන ලද හෝ කරන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයාට, නියෝජ්‍ය කොමසාරිස්වරයාට, ජ්‍යෙෂ්ඨ සහකාර කොමසාරිස්වරයන්ට, සහකාර කොමසාරිස්වරයන්ට හෝ මේ පනතේ 44 වන, 46 වන, 47 වන, 49 වන, 52 වන, 66 වන සහ 67 වන වගන්ති යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් යථා පරිදි බලය දෙන ලද හෝ පත් කරන ලද වෙනත් තැනැත්තන්ට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 75 වන වගන්තිය සංශෝධනය කිරීම.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 75 වන වගන්තියේ "නිලධරයා" යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

'"නිලධරයා" යන්නට සමිතියක හෝ එහි යම් ශාඛාවක සභාපතිවරයා, උප සභාපතිවරයා, ලේකම්වරයා, භාණ්ඩාගාරිකවරයා හෝ කළමණාකාරවරයා හෝ සමිතියක කාරක සභාවේ සාමාජිකයකු සහ සමිතියේ කටයුතු සම්බන්ධයෙන් විධාන දීමට යථා පරිදි බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තකු ඇතුළත් වේ.'.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත හැම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත [illegible] දායක මුදල් භාරගනු ලැබේ.